# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍යපශ්චාත් උපාධි ආයතනයෙහි පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා අදාල සුදුසුකම් සම්පූර්ණ කල අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු සඳහා වන අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ ආයතන හා සාමාන්‍ය පරිපාලන,වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, අංක 160, මහාචාර්ය නන්දදස කෝදගොඩ මාවත, කොළඹ 07 යන ලිපිනයට හෝ recruitment@pgim.cmb.ac.lk වෙත 2024.10.08 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. කරුණාකර අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහල කෙලවරේ හෝ ඊමේල් පතෙහි විෂය තීරයේ අයදුම්කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කරන්න.

අදාල අයදුම්පත් ආකෘතිය හා වැඩිදුර විස්තර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් අඩවිය වන https://pgim.cmb.ac.lk වෙතින් ලබාගත හැක. අදාල නිර්දිෂ්ඨ අයදුම්පත් ආකෘති මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

අසම්පූර්ණ අයදුම්පත් හෝ අවශ්‍ය විස්තර සම්පූර්ණ නොමැති මෙන්ම සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සනාථ කිරීමට අවශ්‍ය සහතිකපත්‍රවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලබන අතර, ප්‍රතික්ෂේප වූ අයදුම්පත් කිසිදු හේතුවක් මත යළි සලකා බලනු නොලැබේ.

## 01. කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (තනතුරු 06)

**සුදුසුකම් :**

1. අ.පො.ස. (සා/පෙළ) විභාගය, එක් වරකදී.
   - සිංහල භාෂාව/ දෙමළ භාෂාව
   - ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍ය
   - ගණිතය

   යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත් විය යුතුය.

**සහ**

2. අපොස. (උ/ පෙළ) විභාගය, එක් වරකදී (පොදු සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) සියලුම විෂයයන්ගෙන් සමත් විය යුතුය.
3. පහත සඳහන් සාමාර්ථයන් සහිත අයවලුන් සඳහා විශේෂයෙන් සලකා බලනු ලැබේ.
   - අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයක(06) කාලයකට නොඅඩු පරිගණක යෙදවුම් සම්බන්ධව පිළිගත හැකි සුදුසුකම්.

   **සහ**

   - ආ) පරිගණක යෙදවුම් භාවිතයෙහි වසර දෙකක පළපුරුද්ද.

**වැටුප් පරිමාණය** : රුපියල් 30,725 - 17X300 - 35,825 (මසකට) - 2020.01.01 දිනැති [UMN I(III)] ප්‍රකාරව සහ අනෙකුත් රජයේ අනුමත දීමනා හිමිවේ.

**තෝරා ගැනීම** : ලිඛිත විභාගයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** : අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනය වන විට අවුරුදු 18 නොඅඩු විය යුතු අතර, 30 ට නොවැඩි විය යුතුය.

## 02. තාක්ෂණ නිලධාරී (ශ්‍රව්‍ය දෘෂ්‍ය) (තනතුරු 01)

**සුදුසුකම් :**

i. අ.පො.ස. (උ/ පෙළ) විභාගය, ඕනෑම විෂය ධාරාවකින් විෂයන් තුනකින් (03) සමත්වීම.

**සහ**

ii. තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පාර්ලිමේන්තුවේ පනතක් මගින් ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයක් මගින් ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ/ ඉලෙක්ට්‍රොනික්/ මල්ටිමීඩියා හෝ ශ්‍රව්‍ය දෘෂ්‍ය තාක්ෂණ ශිල්ප ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

iii. තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින්, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සංදේශ/ ඉලෙක්ට්‍රොනික/ මල්ටිමීඩියා හෝ ශ්‍රව්‍ය දෘෂ්‍ය තාක්ෂණ ශිල්ප ක්ෂේත්‍රයේ ඉහත (ii) (අ) සුදුසුකම්වලට සමාන බවට පිළිගත් තාක්ෂණ සුදුසුකම් ලබා තිබීම සමග ප්‍රසිද්ධ ආයතනයක ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්ය පිළිබඳ වසර එකක පළපුරුද්ද.

**තෝරා ගැනීමේ ක්‍රම වේදය** : ලිඛිත සහ / හෝ ප්‍රායෝගික විභාගයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**වයස** : අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : රුපියල් 31,625 - 7X300; 10X355-37,275 (මසකට) 2020.01.01 දිනට [(U MT 1(III)]

## 03. වැඩ අධීක්ෂක (සිවිල්) (තනතුරු 01)

**සුදුසුකම් :**

i. ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව හෝ සමාන සුදුසුකම් සහ එවන් සුදුසුකම් ලබාගැනීමෙන් පසුව අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර හතරක පළපුරුද්දක් ලබා තිබීම.

අදාල වසර හතරක පළපුරුද්ද සඳහා පිරියත ඇතුළත (In-Plant) පුහුණු කාලය ගණනු නොලැබේ.

ii. ජාතික තාක්ෂණ සහතිකය හෝ සමාන සුදුසුකම් සමග අවම වශයෙන්, අදාල සුදුසුකම් ලබාගැනීමෙන් පසුව අදාල ක්ෂේත්‍රයේ වසර දහයක පළපුරුද්ද.

**වැටුප** : රුපියල් 37,275 - 18X470 - 45,735 (මසකට) 2020.01.01 දිනට (U MN 2 (II))

**වයස** : අදාල අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය** : ලිඛිත විභාගයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**සටහන :**

1. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
2. මනා චරිතයකින් යුක්ත විය යුතුය.
3. මෙම තනතුරු සඳහා රජය මගින් අනුමත කළ දීමනා හිමිය.

**අධ්‍යක්ෂ, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත,**
**කොළඹ 07.**
**2024.09.22**